**මුදල් මණ්ඩලය**
**ශ්‍රී ලංකා මහ බැංකුව**

**2021 මාර්තු 31 | මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන විධාන | 2021 අංක 03**

**ද්‍රවශීල වත්කම් විධානය සංශෝධනය කිරීම**

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ඇති වී තිබෙන අභියෝගාත්මක මෙහෙයුම් තත්ත්වය සලකා බලමින්, බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් පවත්වා ගත යුතු ද්‍රවශීල වත්කම් ප්‍රමාණය පිළිබඳ විධානයට පහත සංශෝධනයන් මුදල් මණ්ඩලය විසින් නිකුත් කරනු ලබයි.

ඒ අනුව, මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන ලද 2020 අංක 07 දරන ද්‍රවශීල වත්කම් විධානය සංශෝධනය කිරීම විධානයේ විධාන අංක 5 විධානය පහත ලෙස ප්‍රතිස්ථාපනය කර සංශෝධනය කෙරේ.

**5. වලංගු කාල පරිච්ඡේදය**

5.1 වර්තමාන අභියෝගාත්මක තත්ත්වය මත ද්‍රවශීලතාවය පිළිබඳ අපහසුතාවයන්ට පත්ව සිටින බලපත්‍රලාභී මුදල් සමාගම් වලට පහසුකම් සැලසීම සඳහා අංක 2,3 සහ 4.1 විධානයන් 2021.06.30 දින දක්වා මාස තුනක (3) කාලයක් සඳහා දීර්ඝ කරන ලදී.

5.2 ඉහත 5.1 හි දක්වා ඇති දීර්ඝ කිරීමේ කාලය ඉකුත්වීමෙන් පසු 2013 අංක 04 දරන මුදල් සමාගම් (ද්‍රවශීල වත්කම්) විධානය අනුව ද්‍රවශීල වත්කම් අවශ්‍යතා පවත්වා ගැනීම සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් අවශ්‍ය පියවර ගත යුතුය.

**මහාචාර්ය ඩබ්ලිව් ඩී ලක්ෂ්මන්**
මුදල් මණ්ඩලයේ සභාපති සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති